## වාරණ නියෝගය.

### කොළඹ දිසා අධිකරණයේදී ය.

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

**පැමිණිලිකරු.**

| | | |
|---|---|---|
| **නඩු අංකය** | **: 3155/විශේෂ** | |
| **ස්වභාවය** | **: විශේෂ** | |
| **වටිනාකම** | **: රු.100,000/-** | |
| **කාර්ය පටිපාටිය** | **: සාමාන්‍ය** | |

**එදිරිව**

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු,

අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන් සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලික් ලංකා ජපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ප්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජාපනයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කඳුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොජි ඉතෝ.

<u>විත්තිකරුවෝ.</u>

<u>ඉහත නම් සඳහන් 1 සිට 4 දක්වා වූ විත්තිකාර සමාගම් වෙතය.</u>

ඉහත නම සඳහන් පැමිණිලිකරුගේ 1990 සැප්තැම්බර් මස 12 දිනැති දිවුරුම් පතේ පිටපත හා 'පී1' සිට 'පී54' දක්වා ලකුණු කළ ලියකියවිලිවල පිටපත් සමග මෙයට පිටපතක් අමුණා ඇති 1990 සැප්තැම්බර් මස 13 දිනැති පැමිණිලිපතේ (උ) සහ (ඌ) ආයාචනවල අයැද ඇති පරිදි අතුරු තහනම් නියෝග සඳහා වන ඉල්ලීමක් පැමිණිලිකරු කර ඇති හෙයින්,

1990 සැප්තැම්බර් මස 17 සහ 18 දිනයන්හි මෙම කාරණය කොළඹ දිසා විනිසුරු තැන්පත් පී.විජයරත්න මැතිතුමා ඉදිරිපිට පැමිණිලිකරු වෙනුවෙන් නීතිඥ ද සිල්වා සහ පෙරේරා ව්‍යාපාරයේ උපදෙස් පිට නීතිඥ ඒ.ඒ.ඇම්.ඉලියාස් මහතා, නීතිඥ ඇස්.ශ්‍රීස්කාන්ත මහතා සහ ජනාධිපති නීතිඥ කනග්-ඊස්වරන් මහතා සමග රාජ නීතිඥ පී.නවරත්න රාජා මහතා පෙනී සිටියදී ගනු ලැබූ අතර, එහි පැමිණිලිපත, දිවුරුම් පත සහ 'පී1' සිට 'පී54' දක්වා ලකුණු කළ ලියකියවිලි සළකා බලා, තවද, අතුරු තහනම් නියෝගය සඳහා වන එකී ඉල්ලීම තහවුරු කිරීමේ දී රාජ නීතිඥ මහතා ඉදිරිපත් කළ කරුණුවලට සවන් දී මෙම අධිකරණය, වෙනත් දේ අතර පැමිණිලිකරුට පැමිණිලි පතේ එකී (උ) සහ (ඌ) ආයාචනා පරිදි, 1 වන, 2 වන, 3 වන සහ 4 වන විත්තිකාර සමාගම්වලට විරුද්ධව වාරණ නියෝග ලබා දී ඇති හෙයින් ද,

ඒ අනුව ඉහත නම සඳහන් 2 වන විත්තිකාර ඔබ සමාගම, ඔබ සමාගම විසින්ම හෝ ඔබ සමාගමේ නියෝජිතයින්, සේවකයින් සහ වෙනත් කොයිකවර හැටියකින් වුවත්,

<u>අතුරු තහනම් නියෝග සඳහා වන පැමිණිලිකරුගේ ඉල්ලීම අවසානයට නිගමනය කරන තුරු</u> පැමිණිලි පතේ සඳහන් කර ඇති ගිවිසුම්, එනම් ඉදිකිරීමේ ගිවිසුම, සැපයීමේ ගිවිසුම, සැලසුම් සහ අධීක්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ එකී ඇපකර දෙක යටතේ කොයි කවර ආකාරයකින් වුවත්, මොන මොන කවර මුදලක් හෝ නියම කර ඉල්ලා සිටීමෙන්, ඉල්ලා සිටීමෙන්, අරගැනීමෙන්, ලබාගැනීමෙන් සහ/හෝ එකතුකර ගැනීමෙන්

වළක්වා නිවාරණය කර දැන් නියෝග කරන අතර, මෙම අධිකරණය විසින් මෙයින් නියෝග කරනු ලැබේ.

මෙම නියෝගයට අවනත වීමට හා ඒ අනුව ක්‍රියා කිරීමට ඔබට මෙයින් නියම කරනු ලැබේ.

මේ නිසා මෙය පැහැරහැරීම අනුව නීතියෙන් දඬුවම්පමුණුවන ලැබේ. (පැමිණිලිපතේ ඉහතකී දිවුරුම් පතේ සහ 'පී1' සිට 'පී54' දක්වා ලදුනු කළ ලියකියවිලිවල පිටපත් මීට අමුණා ඇත.)

1990 ක්වූ සැප්තැම්බර් මස 20 දිනෙන් යුතුව මාගේ අත්සනින් නිකුත් කරන ලදී.

කොළඹ දිසා විනිසුරු.




අප විසින් සකස් කරන ලදී.

පැමිණිලිකරුගේ නීතිඥයින්.

====================

මෙයින් දැක්වෙන්නේ කොළඹ දිසා අධිකරණයේ අංක 3155/ ... නඩුවේ 2 වැනි විත්තිකරු වෙත නිකුත් කළ වාරණ නියෝගයේ සත්‍ය පිටපතක් බැව් මෙයින් සහතික කරමි.

සැසඳුවේ:- 8/ 9/30.7.7.60

රෙජිස්ට්‍රාර්.